# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/12/වා.ස්.මා

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2025.09.01

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :- 2025/12

ප්‍රධාන කාර්යාලයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් ඇතුළු අංශ ප්‍රධානීන්,
සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන්,
සමෘද්ධි කළමනාකරුවන්, සමෘද්ධි සංවර්ධන නිලධාරින් හා
දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිලධාරින් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා ප්‍රජාමූල බැංකු පද්ධතිය තුල සේවය කරන නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය - 2026</u>**

මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත යොමු කර ඒවා සංශෝධනයට ලක් කර නැවත අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. මේ හේතුව මත 2026 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය නිකුත් කිරීම ප්‍රමාද වූ බව කාරුණිකව දැනුම් දෙමි. එහෙත් මෙම වර්ෂයේ ඉදිරි කාලපරිච්ඡේදය තුළ ස්ථාන මාරු මණ්ඩල රැස්වී 2026 වර්ෂයට අදාළ ස්ථාන මාරු ලබාදීමට කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් දන්වමි.

02. 2026 වර්ෂය සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටි රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වන පරිච්ඡේදයේ අදාළ විධිවිධාන වලට අනුව ක්‍රියාත්මක කිරීම සඳහා මේ සමඟ යොමු කරමි.

03. පහත සඳහන් තනතුරුවලට අදාළ ස්ථාන මාරු පටිපාටි ඉදිරිපත් කරමි.

04. ඒ අනුව, ප්‍රධාන කාර්යාලයේ / දිස්ත්‍රික්කයේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ / ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති වල සේවය කරන සියළුම නිලධාරින් දැනුවත් කර 2026 වර්ෂයට අදාළ වාර්ෂික ස්ථාන මාරුවීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

i. විධායක නිලධාරි ස්ථාන මාරු පටිපාටිය
ii. සමෘද්ධි කළමනාකරු ස්ථාන මාරු පටිපාටිය
iii. අභ්‍යන්තර විගණ නිලධාරි ස්ථාන මාරු පටිපාටිය
iv. කළමණාකරණ සේවා නිලධාරි / කළමණාකරණ සහකාර නිලධාරි ස්ථාන මාරු පටිපාටිය
v. සමෘද්ධි සංවර්ධන නිලධාරි ස්ථාන මාරු පටිපාටිය
vi. රියදුරු ස්ථාන මාරු පටිපාටිය
vii. කාර්යාල සේවක සේවය / කාර්යාල කාර්ය සහායකයින් ස්ථාන මාරු පටිපාටිය

04. 2025 වර්ෂයේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ දී ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල විවිධ ගැටළු සහගත තත්ත්වයන් ඇති වූ බැවින් මාරු මණ්ඩල රැස්වීමේ දී අදාළ වෘත්තීය සමිති නියෝජිතයන් අනිවාර්යෙන්ම සහභාගි කරවා ගෙන මාරු මණ්ඩලය විසින් ගනු ලබන තීරණ පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

සී.ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:-

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) රා.ආ. - අ.ක.ස.
3. ප්‍රධාන ගණකාධිකාරී - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අ.ක.ස.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |